#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #SundayLankadeepa #SundayMawbima #Silumina #December2

මාතර ඝාතන සිදුවීමේ තොරතුරු මේ වනවිට ජනමාධ්‍ය ඔස්සේ පමණක් නොව සමාජ මාධ්‍ය ජාලයන් ඔස්සේ පවා ප්‍රචාරය වී තිබේ. එසේම එම ඝාතන සිදුවීමේ බාලවයස් සැකකරුවන්ගේ අනන්‍යතාවයන්ද සමාජ මාධ්‍ය ජාලයන් ඔස්සේ හෙළිදරව්වූ වී තිබිණි. ඉන් පසුව ඇතැම් පුවත්පත් මගින්ද එම බාලවයස් සැකකරුවන්ගේ අනන්‍යතාවයන් සිය ප්‍රවෘත්ති වාර්තා ඔස්සේ නොසඟවා ඉදිරිපත් කිරීමට කටයුතු කොට තිබුණි. එසේම දිවයින පුවත්පත මගින් එම සිදුවීමට මුල් වූ බව කියන තරුණියගේ ෆේස්බුක් ගිණුමේ සේයාරූ පවා ප්‍රසිද්ධ කිරීමට කටයුතු කොට තිබුණි. සමාජ මාධ්‍ය ජාලයන් ඔස්සේ අනාවරණය වී තිබුණත්, පුවත්පත් මගින් බාලවයස්කාර සැකකරුවන්ගේ තොරතුරු ප්‍රසිද්ධ කිරීමේ ගැටළුවක් නොතිබේද? මේ පිළිබඳව ඔබගේ අදහස කුමක්ද?